සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය - I,II

කාලය / நேரம் / Time: පැය තුනයි

නම / பெயர் / Name ..........................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ......................................

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි

## I කොටස

උපදෙස්.

* අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
* **සියළුම ප්‍රශ්න** වලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1) ,(2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙනහෝ පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

- **පහත සිද්ධිය ඇසුරින් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සරසි කන්ස්ට්‍රක්ෂන්ස් නමින් විදේශගත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින්ට ගෘහ නිර්මාණ ඉදිකර දීමේ ව්‍යාපාරයක් සාරංග විසින් පවත්වාගෙන යනු ලැබේ.මොරටුව විශ්ව විද්‍යාලයේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධියක් හදාරා ඇති සාරංග නවීනතම මෝස්තර වලට අනුකූලව ගෘහ නිර්මාණ සැළසුම් ඇඳීමට දක්ෂතාවයක් දක්වයි.ගුණාත්මක අමුද්‍රව්‍ය යොදා ගනිමින් ගෘහ නිර්මාණ කර ඇති නිසා ඔහු ප්‍රසිද්ධියට පත්ව ඇති අතර ඔහු ලවා තම ගෘහ නිර්මාණය කරවා ගැනීමට විදේශගතව සිටින ශ්‍රමිකයින් වැඩි උනන්දුවක් දක්වයි.

(1) සරසි කන්ස්ට්‍රක්ෂන්ස් ව්‍යාපාරය විසින් සපුරා ගනු ලබන මූලික මිනිස් අවශතාවය වන්නේ

(i) නිවාස (iii) තට්ටු නිවාස

(ii) මන්දිර (iv) කබානා

(2) නිෂ්පාදනයේ ස්වභාවය අනුව සරසි කන්ස්ට්‍රක්ෂන්ස් ව්‍යාපාරය අයත් වන්නේ,

(i) සේවා සැපයීමේ ව්‍යාපාර (iii) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපර

(ii) ප්‍රාථමික නිෂ්පාදන ව්‍යාපාර (iv) භාණ්ඩ හා සේවා නිෂ්පාදන ව්‍යාපාර

(3) ඉහත සිද්ධියට අනුව වඩාත්ම ගැලපෙන ව්‍යාපාර අරමුණක් වන්නේ,

(i) ගුණාත්මක නිෂ්පාදන ලබාදීම (iii) ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම

(ii) ලාභ ඉපැයීම (iv) රැකියා උත්පාදනය

(4) සරසි කන්ස්ට්‍රක්ෂන්ස් ව්‍යාපාරය සතු ශක්තීන් වන්නේ

(i) ගනුදෙනුකරුවන්ගේ නිවාස සාදවා ගැනීමට ඇති ඉල්ලුම

(ii) ගුණාත්මක අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිවාස නිර්මාණය කිරීම.

(iii) මොරටුව විශ්ව විද්‍යාලයේ ගෘහනිර්මාණය පිළිබඳ උපාධියක් හදාරා තිබීම.

(iv) දිනෙන් දින නිවාස සඳහා ඇති අවශයතා වැඩි වීම.

(5) නවීන මෝස්තර වලට අනුව ගෘහනිර්මාණ සැලසුම් ඇඳීමට ඔහු සතු හැකියාව අයත් නිෂ්පාදන සාධක වන්නේ,

(i) ශ්‍රමය (iii) ප්‍රාග්ධනය

(ii) භූමිය (iv) ව්‍යවසාය

(6) ව්‍යාපර කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන ඇල්මැති පාර්ශවයන්හි අරමුණු කිහිපයක් පහත දැක්වේ

A ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම

B ආයෝජනයේ සුරක්ෂිතතාවය

C තම නිෂ්පාදිත වල මිල තීරණය කිරීම

ඉහත A,B හා C යන අරමුණු ඉටුකර ගැනීමට උනන්දුවක් දක්වන පාර්ශවයන් පිළිබඳ දැක්වෙන පිළිතුර වන්නේ,

(i) පාරිභෝගිකයින්, කලමනාකරුවන්, අයිතිකරුවන්

(ii) අයිතිකරුවන්, කලමනාකරුවන්, සේවකයන්

(iii) ගනුදෙනු කරුවන්, අයිතිකරුවන්, තරඟකරුවන්

(iv) සැපයුම්කරුවන්, කලමනාකරුවන්,රජය

(7) ව්‍යාපාර පරිසරයේ සිදුවූ වෙනස්කම් කිහිපයක් දැක්වේ.

A බැංකු පොළී අනුපාතය ඉහළ දැමීම.

B වාහන ආනයන තහනම ලිහිල් කිරීමට තීරණය කිරීම

C ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය වැඩි වීම.

D මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද මුදල ඉහළ දැමීමට රජය තීරණය කිරීම.

ඉහත සිදුවීම් අතුරින් ආර්ථික පරිසර සාධක සඳහා නිදසුන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(i) A හා D | (iii) A හා C

(ii) C හා B | (iv) C හා D

(8) පොදු හා පෞද්ගලික අංශ දෙකෙහිම ක්‍රියාත්දක විය හැකි ව්‍යාපාර සංවිධාන වනුයේ,

(i) රාජ්‍ය දෙපාර්තමේන්තු | (iii) සීමාසහිත සමූපකාර සමිති

(ii) සමාගම් | (iv) රාජ්‍ය සංස්ථා

(9) ඉතිරිකිරීමේ ගිණුමක් ආරම්භ කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජනයක් නොවන්නේ,

(i) පොළී ආදායමක් ලැබීම | (iii) හරබත් මගින් ගනුදෙනු කල හැකි වීම

(ii)ණය මුදලක් ලබා ගැනීමට පහසුවක් වීම | (iv) බැංකු අයිරා පහසුකම් ලබා ගත හැකි වීම

(10) විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා වල අවාසියක් ලෙස සැළකිය හැක්කේ,

(i) දවසේ ඕනෑම වේලාවක ගනුදෙනු කළ හැකි වීම | (iii) කාර්යයන් පහසුවෙන් හා ඉක්මනින් කළ හැකි වීම

(ii) අවදානම් අඩුවීම | (iv) සෑම වෙළඳසැලකම භාවිත කළ නොහැකි වීම

(11) රක්ෂණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ

A ඔප්පුවේ වටිනාකම අවදානම හා ගෙවීමේ හැකියාව මත තීරණය වේ.

B ගිවිසුමට අදාළ සියලු කරුණු හෙළිදරව් කිරීම.

C රක්ෂණය කිරීමට නීත්‍යානුකූල අයිතියක් තිබිය යුතුය.

D අවදානම නිශ්චිත වේ.

E හානිපූරණ මූලධර්මය අදාළ නොවේ.

ඉහත ප්‍රකාශ අතරින් ජීවිත රක්ෂණයට පමණක් බලපාන ප්‍රකාශය දැක්වෙනුයේ,

(i) A ,B,D | (iii) A,D,E

(ii) B,C,D | (iv) C,D,E

(12) විදුහල්පතිතුමා උදෑසන රැස්වීම ඇමතීම ...........(1) .........සන්නිවේදන මාධ්‍ය වන අතර මාර්ගගත ක්‍රමයට විභාගය අයදුම් කිරීම ........(2).......... සන්නිවේදන ක්‍රමයට නිදසුනක් වේ.

ඉහත (1) හා (2) හිස්තැන්වලට අදාල නිවැරදි පිළිතුර වනුයේ,

(i) වාචික , විද්‍යුත් ලිඛිත | (iii) වාචික,විද්‍යුත් වාචික

(ii) වාචික , ලිඛිත | (iv) වාචික , සංඥාහා සංකේත

(13) 1990 පොදු දුරකතන අංකය ඇමතීමෙන් සුවසැරිය ගිලන්රථ සේවාව නොමිලේ ලබා ගත හැකිය.

ඉහත ප්‍රකාශනයේ ගම්‍ය වන ප්‍රවාහන මූලිකාංගය වන්නේ,

(i) මාර්ගය | (iii) බලය

(ii) මාධ්‍ය | (iv) පර්යන්තය

(14) පාසල් ක්‍රීඩා උළෙල පැවැත්වෙන දිනය තීරණය කිරීම හා එක් එක් නිවාස සඳහා ආචාර්ය මණ්ඩලය පත් කිරීමට අදාල කලමනාකරණ කාර්යයන් අනුපිළිවෙලින් දැක්වෙනුයේ,

(i) සංවිධානකරණය හා මෙහෙය වීම
(ii) සැලසුම්කරණය හා මෙහෙයවීම
(iii) සංවිධානකරණය හා සැලසුම්කරණය
(iv) සැලසුම්කරණය හා සංවිධානකරණය

(15)"සබන් කැට දෙකක් ගත්විට එකක් නොමිලේ" මෙම ප්‍රකාශයට අදාළ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යා වනුයේ,

(i) නිෂ්පාදිතය
(ii) මිල
(iii) ස්ථානය
(iv) ප්‍රවර්ධනය

(16)අවදානම වැඩි ප්‍රතිලාභයද වැඩි ආයෝජන මාර්ගයකි

(i) කොටස්වල ආයෝජනය කිරීම
(ii) ඉඩමක් මිලදී ගැනීම
(iii) රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක් මිලදී ගැනීම
(iv) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම

(17)පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදුවූ ගනු දෙනුවකි

- රු.25,000 ක බඩු තොගයක් අත්පිට මුදලට විකිණීම

මෙම ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ,

(i) වත්කම් හා වගකීම් පමණක් වෙනස් වේ
(ii) වගකීම් පමණක් වෙන්සවේ
(iii) වත්කම් පමණක් වෙනස්වේ
(iv) වත්කම්,වගකීම්,හිමිකම් යන සියල්ලම වෙනස්වේ

(18)ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ හිමිකම් වැඩිවීම හා වගකීම් අඩුවීමට බලපාන ගනු දෙනුව වන්නේ,

(i) රු.50000 ක බඩු තොගයක් ණයට ගැනීම
(ii) ණයහිමියෙකුට රු. 10000 ක් ගෙවීම
(iii) අයිතිකරු රු.5000 ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රැගෙන යාම
(iv) හිමිකරු විසින් තම පුද්ගලික මුදලින් ව්‍යාපාරයේ ණය හිමියන්ට රු.10000 ක් ගෙවීම

(19) විසල් රු.10000 කට මිලදී ගත් බඩු තොගයක් රු.15000 කට ණයට විකුණන ලදී.මෙම ගනුදෙනුවෙන් ව්‍යාපාරයේ මුළු වත්කම්වල වටිනාකම

(i) රු.5000 කින් වැඩිවේ
(ii) රු.10000 කින් වැඩිවේ
(iii) රු. 10000 කින් අඩුවේ
(iv) වෙනස් නොවේ

(20) ජයන්තගේ ව්‍යාපාරයේ 2023/02/01 දිනට ගිණුම් සමීකරණයේ ශේෂයන් මෙසේය

| වත්කම් | = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 300, 000 | = | 200,000 + | 100,000 |

එක් ගනු දෙනුවක්සිදුවීමෙන් පසු මෙම සමීකරණය මෙසේ වෙනස් විය.

| වත්කම් | = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 245,000 | = | 195,000 + | 50,000 |

සිදුවී ඇති ගනුදෙනුව වන්නේ,

(i) බැංකු ණය ගෙව්වා රු.50,000
(ii) ණය හිමියන්ට ගෙව්වා රු.50,000
(iii) බැංකු ණය වාරිකය හා ණය පොළිය ගෙව්වා රු.55,000 කි
(iv) ණය හිමියන්ට ගෙව්වා රු.50,000 යි.ඔවුන්ගෙන් ලද වට්ටම රු.5,000 කි.

(21) ව්‍යාපාරයේ ලෙජරයේ දැක්වෙන ගැණුම් ගිණුම ......(1).... ගිණුමක් වන අතර ගැනිලි ගිණුම ....(2) ....ගිණුමක් වේ. ඉහත ප්‍රකාශනයේ (1) හා (2) යන ස්ථාන වලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) හිමිකම් ගිණුම, වියදම් ගිණුම
(ii) වියදම් ගිණුම, ආදායම් ගිණුම
(iii) වත්කම් ගිණුම, වියදම් ගිණුම
(iv) වියදම් ගිණුම , හිමිකම් ගිණුම

(22) පහත සඳහන් ගනු දෙනු අතුරින් පොදු ජ'නලයේ සටහන් කල යුතු ගනු දෙනුව තෝරන්න.

(i) ව්‍යාපාරයේ බඩු තොගයක් රු.9000 කට විකිණීම.
(ii) ව්‍යාපරයට රු.25000 ක් වටිනා බඩු තොගයක් ණයට ගැනීම.
(iii) ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ලී බඩු මිලදී ගැනීම රු.15000 කි.
(iv) ණය ගැතියන්ගෙන් රු.2000 ක් බොල් ණය ලෙස කපා හැරීම.

(23) ධම්මිකගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු.4000 ක් විය. 2023 අගෝස්තු මාසයේ සුළු මුදල් වියදම රු.3800 ක් විය. සැප්තැම්බර් 01 දින රු.4300 ක් අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදී. ධම්මිකගේ ව්‍යාපාරයේ සුළු මුදල් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) සැප්තැම්බර් මාසය සඳහා සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු.4500 කි.
(ii) අගෝස්තු මාසයේ සුළු මුදල් වියදම රු.4300 කි.
(iii) අගෝස්තු 31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු.500 කි.
(iv) සැප්තැම්බර් මාසයේ සිට සුළු මුදල් අග්‍රිමයේ වැඩිවීම රු.300 කි.

- **පහත සඳහන් තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 24 හා 25 ට පිළිතුරු සපයන්න.**

2023 ජනවාරි 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.16,100 ක් විය. පහත හේතු නිසා එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් වේ.

A තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක් පත් රු.10,000
B ණය ගැති ප්‍රේෂණ රු.3,500
C ස්ථාවර නියෝග රු.7,000

(24) ඉහත හේතු අතුරින් බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩිවීමට බලපාන හේතු මොනවා?

(i) A පමණි
(ii) B පමණි
(iii) A හා C පමණි
(iv) B හා C

(25) 2023 ජනවාරි 31 දිනට සංශෝධිත බැංකු ශේෂය කොපමණද ?

(i) 14,100
(ii) 12,600
(iii) 18,600
(iv) 24,100

(26)ගැණුම් ජ' නලයේ සටහන් කල ගනු දෙනු ලෙජරයට පිටපත් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(i) ණය ගැති ගිණුම හර ගැණුම් ගිණුම බැර
(ii) ණය හිමි ගිණුම හර ගැණුම් ගිණුම බැර
(iii) ගැණුම් ගිණුම හර ණය හිමි ගිණුම බැර
(iv) ගැණුම් ගිණුම හර ණය ගැති ගිණුම බැර

(27)පහත දැක්වෙන ගනුදෙනු අතරින් විකුණුම් ජ' නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,

(i) රු.250,000 ක ව්‍යාපාර පාවිච්චි කල මෝටර් රථයක් සමන්ට විකිණීම.
(ii) රු.12,000 ක භාණ්ඩ තොගයක් අරුණට විකිණීම.
(iii) රු.8,000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට විකිණීම.
(iv) රු.10,000 ක් වූ ලී බඩු අත්පිට මුදලට විකණීම.

(28) අයිතිකරු සතු රු.100,000 ක් වටිනා පරිගණක යන්ත්‍රය ව්‍යාපාරයට යෙදවීමට මූලාශ්‍ර ලේඛණය සහ මූලික සටහන් පොත පිළිවෙලින්,

(i) ගෙවීම් වවුචරය , මුදල් පොත
(ii) ගැණුම් ඉන්වොයිසිය, ගැණුම් ජ' නලය
(iii) ජ' නල් වවුචරය, පොදු ජ' නලය
(iv) විකුණුම් ඉන්වොයිසිය, විකුණුම් ජ' නලය

(29) ව්‍යාපාරයක ගිණුම් තැබීමේ දී සිදු වී ඇති වරදක් පහත දැක්වේ.

- ගැණුම් ගිණුමේ එකතුව රු.1000 කින් වැඩියෙන් සටහන් වීම

ඉහත වරද සිදුවී ඇති අවස්ථාව වන්නේ,

(i) මූලික සටහන් පොත්වලින් ගනු දෙනු ලෙජරයට පිටපත් කිරීමේ දී.
(ii) ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී
(iii) ලෙජර ගිණුම තුලනය කිරීමේ දී
(iv) මූලික සටහන් පොත් වල ගනු දෙනු සටහන් කිරීමේ දී.

(30) පහත දැක්වෙන්නේ ව්‍යාපරයක ගිණුම් තැබීමේ දී සිදු වූ වරදක් නිවැරදි කිරීමට අදාල සටහනකි.

අවිනිශ්චිත ගිණුමහර 15,0003

ණය ගැති ගිණුම බැර 15,000

පහත සඳහන් ප්‍රකාශ අතරින් සිදු වී ඇති වරද වනුයේ,

(i)රු. 15,000 ක ණය ගැති ලැබීම් මුදල් පොතේ පමණක් සටහන් වීම.
(ii) රු. 15,000 ක ණය ගැති ලැබීම් ණය ගැති ගිණුමේ හර පැත්තේ සටහන් වීම.
(iii) රු. 15,000 ක ණය ගැති ණය ගැති ගිණුමේ පමණක් සටහන් වීම.
(iv) රු. 15,000 ක ණය ගැති ලැබීම් මුදල් පොතේ බැර පැත්තේ සටහන් වීම.

(31) කිසියම් ගිණුම් කාලච්ඡේදයක් අවසානයේ නොවිකුණා ඉතිරිව ඇති බඩු තොගය

(i) වත්කමකි (ii) වගකීමකි (iii)ආදායමකි (iv) වියදමකි

(32) ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන වන්නේ,

(i ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලැබීම් හා ගෙවීම් ගිණුම
(ii) ලැබීම් ගෙවීම් ගිණුම, ලාභ අලාභ ප්‍රකාශනය
(iii) ලාභ අලාභ ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(iv) ලැබීම් හා ගෙවීම් ගිණුම, ආදායම් ප්‍රකාශනය

නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක 2023 ජනවාරි මාසයට අදාල පිරිවැය තොරතුරු පහත දැක්වේ,

| | |
|---|---|
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 150 000 |
| ප්‍රාථමික පිරිවැය | 250 000 |
| නිෂ්පාදන ඒකක ගනන | 4 000 |
| පිරිවැය මත ලාභාන්තිකය | 20 % |

(33) ඉහත තොරතුරු වලට අනුව මුළු නිෂ්පාද පිරිවැය වන්නේ,

(i) රු. 250 000 (ii) රු. 150 000 (iii)රු.400 000 (iv) රු.600 000

(34) ඉහත තොරතුරු අනුව ඒකකයක විකුණුම් මිල වන්නේ,

(i) රු. 400 (ii) රු. 380 (iii)රු.480 (iv) රු.120

**පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක 35 සිට 40 දක්වා පිළිතුරු සපයන්න.**

2023 .01.01 දින ආරම්භ කරන ලද සුරිනිගේ ව්‍යාපාරයේ 2023.12.30 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ගෙන ඒමේ කුලී | 4 000 |
| ගොඩනැගිලි (පිරිවැය) | 200 000 |
| ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම (2023.01.01) | 40 000 |
| තොගය(2023.01.01) | 30 000 |
| විකුණුම් | 320 000 |
| ගැණුම් | 120 000 |
| ණය ගැතියෝ | 20 000 |
| විදුලි වියදම් | 4 000 |
| ප්‍රචාරණය | 10 000 |
| කොමිස් ආදායම් | 15 000 |
| දුන් වට්ටම් | 5 000 |
| මුදල් | 22 000 |

අමතර තොරතුරු

- ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමයට 10% බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුය
- 2023.12.31 දිනට ඉතිරි තොගය රු.20 000 කි.
- උපචිත ප්‍රචාරණ වියදම් 3000 කි.

(35)ඉහත ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය

(i) රු. 120 000 (ii) රු. 124 000 (iii)රු.150 000 (iv) රු.154 000

(36) මෙම ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වන්නේ,

(i) රු. 154 000 (ii) රු. 134 000 (iii)රු.200 000 (iv) රු.290 000

(37) සුරිනිගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වන්නේ,

(i) රු. 166 000 (ii) රු. 320 000 (iii)රු.120 000 (iv) රු.186 000

(38) මෙම ව්‍යාපාරයේ 2023.12.31 ගොඩනැගිලිවල ධාරණ අගය වන්නේ,

(i) රු. 140 000 (ii) රු. 160 000 (iii)රු.200 000 (iv) රු.240 000

(39) සුරිනිගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය වන්නේ,

(i) රු. 200 000 (ii) රු. 134 000 (iii)රු.186 000 (iv) රු.159 000

(40) මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම්වල වටිනාකම වන්නේ,

(i) රු. 262 000 (ii) රු. 202 000 (iii)රු.62 000 (iv) රු.92 000

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

**අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)**

ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය - II

නම / பெயர் / Name } ..........................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....................................

**උපදෙස් :-**
**පලමුවන ප්‍රශ්නය ඇතුළුව 1 කොටසින් ප්‍රශ්න දෙකක් ද 11 කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

---

**පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක (I) සිට (X) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1) රුසිරු වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් පවත්වනු ලැබූ ආහාර විජලන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හැදෑරූ අයෙකි. තමා ඉතිරි කර ගත් මුදලින් රු.100,000 ද තමා සතු රු.150,000 ක් වූ පරිගණකයද යොදවා බිලිං විජලනයට පසු ඇසුරුම් කර විකිණීමේ ව්‍යාපාරයක් 2023/10/01 දින රුසිරු Food product නමින් ඇරඹීය. ව්‍යාපාර කටයුතු වල පහසුව සඳහා වාණිජ බැංකුවක රු.50,000 ක් යොදවා ගිණුමක් ආරම්භ කරන ලදී.

වාණිජ මණ්ඩලය මගින් පවත්වන ලද ව්‍යවසායකත්ව අලෙවි ප්‍රදර්ශනය සඳහා තම නිෂ්පාදන ඉදිරිපත් කිරීමෙන් පසු රුසිරුගේ නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් පවතුනි. ඔහුගේ නිෂ්පාදන ජනප්‍රිය වීමත් සමග විදේශිකයන්ගෙන්ද ඉල්ලුමක් ඇති විය. මේ නිසාම සේවකයෙක් බඳවාගෙන ව්‍යාපාරය පුළුල් කිරීමට රුසිරු තීරණය කරන ලදී. විදේශිකයන් සමග ගනුදෙනු කිරීමේදී ඇනවුම් ලබා ගැනීම හා මුදල් ගනුදෙනු කිරීම සඳහා අන්තර්ජාලය භාවිතා කිරීමටද ඔහු අදහස් කරයි.

2023 ඔක්තෝබර් මාසයට අදාළව පහත ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| 2023/10/02 | 12% බැංකු ණයක් ලබා ගැනීම රු.50,000 |
| 2023/10/05 | අමුද්‍රව්‍ය ණයට ගැණුම් සදිනිගෙන් රු.12,000 |
| 2023/10/08 | අමුද්‍රව්‍ය ණයට ගැණුම් සිල්වාගෙන් රු.18,000 |
| 2023/10/10 | ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැනීම රු.20,000 |
| 2023/10/12 | ප්‍රචාරණ වියදම රු.5,000 |
| 2023/10/13 | විජලනය කිරීමේ යන්ත්‍රයක් මිලට ගැනීම රු.15,000 |
| 2023/10/15 | අමුද්‍රව්‍ය ගැණුම් චෙක්පතකින් ගෙව්වා රු.20,000 |
| 2023/10/20 | ගොඩනැගිලි කුලී ගෙව්වා රු.15,000 |
| 2023/10/22 | සේවක වැටුප් රු.30,000 |
| 2023/10/30 | විකුණුම් රු.125,000 |

බැංකු ණය පොළී උපචිතව පවතී.

(i) (අ) ඉහත සිද්ධියේ සඳහන් මූලික මිනිස් අවශ්‍යතාව හා වුවමනාව නම් කරන්න. (ල.01)

(ආ) ඉහත සිද්ධියේ සඳහන් ශක්තියක් හා අවස්ථාවක් නම් කරන්න. (ල.01)

(ii) (අ) මෙම සිද්ධියට අදාළව රාජ්‍ය අංශයට අයත් ආයතන 2ක් නම් කරන්න. (ල.01)

(ආ) එම සංවිධාන ක්‍රමයේ දැකිය හැකි ලක්ෂණ 2ක් නම් කරන්න. (ල.01)

(iii) (අ) රුසිරු විසින් ආරම්භ කරන ලද බැංකු ගිණුම් වර්ගය කුමක්ද? (ල.01)

(ආ) ඉන් රුසිරුට ලබාගත හැකි වාසි 2ක් දක්වන්න. (ල.01)

(iv) (අ) අන්තර්ජාලය හරහා ගනුදෙනු කිරීමේදී භාවිතා කල හැකි විද්‍යුත් ගෙවීමේ ක්‍රමයක් නම් කරන්න. (ල.01)

(ආ) ඉහත සිද්ධියේ සදහන් කළමනාකරණ කාර්යයක් නම් කර උදාහරණයක් දක්වන්න (ල.01)

(V) 2023/10/01 දිනට ගිණුම්කරණ සමීකරණය ලියන්න. (ල.02)

(VI) 2023/10/31 දිනට බැංකු පොළිය ගණනය කර ද්විත්ව සටහන් ලියන්න. (ල.02)

(VII) 2023/10/31 දිනට මුදල් ශේෂය කොපමණද? (ල.02)

(VIII) 2023/10/31 දිනට ගැණුම් ජ'නලය පිළියෙල කරන්න. (ල.02)

(IX) මෙම ව්‍යාපාරයේ 2023/10/31 දිනෙන් අවසන් මාසයේ ශුද්ධ ලාභය ගණනය කරන්න. (ල.02)

(X) 2023/10/31 දිනට රුසිරුගේ හිමිකම කොපමණද? (ල.02)

## I කොටස - ව්‍යාපාර අධ්‍යනය

**ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

2) (i) භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු වීමේ ක්‍රමය බාටාර් ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ. මෙම බාටාර් ක්‍රමයේ ඇති සුවිශේෂී ලක්ෂණ 2ක් දක්වන්න. (ල.02)

(ii) පහත සදහන් ප්‍රකාශන සත්‍යද අසත්‍යද දක්වන්න.

(අ) ව්‍යාපාරයක් යනුවෙන් අදහස් කරන්නේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම හා විකිණීමයි.(.........)

(ආ)ව්‍යාපාර අවදානම් දරමින් නව්‍යතා සම්පාදනය කරමින් කටයුතු කිරීම ව්‍යවසායකත්වය ලෙස හඳුන්වනු ලැබේ. (.........)

(ඉ)පාරිභෝගිකයාගේ ප්‍රධාන අරමුණක් වන්නේ ගුණාත්මක භාණ්ඩ හා සේවා සාධාරණ මිලකට ලබා ගැනීමයි. (.........)

(ඊ)සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම ව්‍යාපාර කළමනාකරුගෙන් බලාපොරොත්තු වන දායකත්වයන්ය. (.........) (ල.02)

(iii) සී/ස මිල්කෝ සමාගම තම නිෂ්පාදන අලෙවිය සඳහා ''රස කිරිහල'' නමින් අලෙවිසැලක් ආරම්භ කරන ලදී. දියර කිරි පැකට් හා බෝතල්. යෝගට් හා කිරිටොෆී මෙම වෙළෙඳසැලෙන් මිලදී ගත හැකි අතර පාසල් දරුවන්, ක්‍රීඩකයින් හා දෙමාපියන් විසින් දිනපතා මෙම අලෙවිසැලට පැමිණීම පුරුද්දක් කරගෙන ඇත.

(අ) මෙම අලෙවිසැලේ සපුරාලන අවශ්‍යතාවය හා වුවමනාවක් දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන් 2ක් නම් කරන්න. (ල.02)

(iv) ස්වභාවිකව වැවෙන පන් වර්ගයක් යොදාගෙන පන්මලු, පැදුරු හා වට්ටි නිෂ්පාදනය කිරීම අමලේග් රැකියාවයි. ජලජ ප්‍රදේශ වලින් ලබා ගන්නා පන් අව්වේ වේලා වර්ණ යොදා නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගනී. නව මෝස්තර රටා යොදා ගනිමින් අලංකාර පැදුරු හා මලු නිෂ්පාදනයට අමල් දක්ෂතාවයක් දක්වයි.

(අ)ඉහත සිද්ධියට අදාළ නිෂ්පාදන සාධක 2ක් නම් කරන්න.

(ආ)එම සාධක වලට අදාළව උදාහරණ දක්වන්න. (ල.02)

3) (i) චෙක්පත් රේඛනය කිරීම තුලින් බලාපොරොත්තු වන්නේ චෙක්පතකට වැඩි ආරක්ෂාවක් සැලසීමයි.

(අ)චෙක්පතකට සම්බන්ධ පාර්ශ්ව 02 ක් නම් කරන්න. (ල.01)

(ආ)චෙක් පත් රේඛන වර්ග 2ක් නම් කරන්න. (ල.01)

(ii) පහත සඳහන් ප්‍රකාශන සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) පාරිභෝගිකයන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා විකිණීම තොග වෙළෙඳාමේ ලක්ෂණයකි. (...........)

(ආ) ස්ථාවර තැන්පතු සඳහා ලැබෙන පොළිය මාසිකව කල්පිරුණු පසුව හෝ ගිවිසගත් පරිදි ලබාගත හැකිය. (...........)

(ඉ) ජීවිත රක්ෂණ ඔප්පුවේ වටිනාකම ජීවිත අවදානම හා රක්ෂිතයාගේ ගෙවීමේ හැකියාව මත තීරණය වේ. (...........)

(ඊ) චෙක්පතක මුහුණත සඳහන් ආදායකයාගේ නම ඒ ආකාරයටම චෙක්පත පිටුපස ලිවීම චෙක්පත පිටසන් කිරීමයි. (...........)

(ල.02)

(iii) ව්‍යාපාරිකයෙකු වූ ප්‍රසාද් තම ව්‍යාපාරික ගොඩනැගිල්ලට රු.8,000,000 ක් වූ ගිනි රක්ෂණ ඔප්පුවක් ලබාගන්නා ලදී. ගොඩනැගිල්ලේ කොටසක් ගින්නෙන් විනාශ වූ අතර සිදු වූ අලාභය රු.2,000,000 කි.

(අ) ඔහුගේ ව්‍යාපාරයට සිදු වූ අලාභයට කොපමණ වන්දි මුදලක් ලබාගත හැකිද? එයට අදාළ රක්ෂණ මූලධර්මය කුමක්ද? (ල.01)

(ආ) දේපළ රක්ෂණය වැදගත් වීමට හේතු 2ක් දක්වන්න. (ල.01)

(iv) "නිපා" වසංගත රෝගය ඉන්දියාවේ පැතිරී යන බවත් එය ශ්‍රී ලංකාවේද පැතිරී යා හැකි බව රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදකයා විසින් ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව වසංගත හා බෝවන රෝග පිළිබඳ ආයතනයේ අධ්‍යක්ෂකවරයා විසින් රෝග ලක්ෂණ පිළිබඳව විස්තර කල අතර ජනතාවට සෞඛ්‍යාරක්ෂිත ක්‍රම අනුගමනය කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

(අ) ඉහත සිද්ධියේ සඳහන් සන්නිවේදන මාධ්‍ය හා සන්නිවේදන ක්‍රමය නම් කරන්න.

(ආ) සිද්ධියට අදාළව සන්නිවේදන මූලිකාංග 2ක් උදාහරණ සහිතව දක්වන්න. (ල.02)

4) (i) සන්ධ්‍යා මදුරු දැල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රමිතියකට අනුකූලව මදුරු දැල් නිෂ්පාදනය කිරීමට ඇය තීරණය කර ඇත. මදුරු දැල් සඳහා ඉල්ලුම වැඩි වීමත් සමග මදුරු දැල් මැසීම සඳහා සේවිකාවන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී.

(අ) ඉහත සිද්ධියේ සඳහන් කළමනාකරණ කාර්යයන් 2ක් ලියන්න.

(ආ) එම කළමනාකරණ කාර්යයන් සඳහා උදාහරණ 2ක් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) කළමනාකරණ ක්‍රියාවලිය සිදු කිරීමේදී ව්‍යාපාරයේ මානව සම්පත් නිසිලෙස හැසිරවීමේ ක්‍රියාවලිය මෙහෙයවීමයි.

(ආ) අලෙවිකරණ මිශ්‍ර යේ විචල්‍යන් අතුරින් ව්‍යාපාරයකට ආදායම් ලබාදෙන එකම විචල්‍ය වන්නේ මිලයි. (.............) (.............)

(ඉ) කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ සමාගම් රෙජිස්ට්‍රාර් මගිනි. (.............)

(ඊ) භාණ්ඩාගාර බිල්පත් යනු රජයේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කරන බිල්පත් විශේෂයකි. (.............)

(ල.02)

(iii) සම්පත් ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණය පිළිබඳ උපාධිධාරියෙකි. උසස් පෙළ සිසුන් හා ගුරුභවතුන් සඳහා ගිණුම්කරණ මාතෘකා වලට අදාළව CD පටයක් නිකුත් කර ඇත. මෙහි මිල රු.2,000 කි. මෙම CD පටය ප්‍රධාන පොත්සල් වලින් ලබාගත හැකි අතර සිසුන්හට එම CD පටය මිලදී ගැනීමේදී 5% ක වට්ටමක් හිමි වේ.

(අ) මෙම සිද්ධියේ සඳහන් අලෙවිකරණ මිශ්‍ර යේ විචල්‍යයන් නම් කරන්න.

(ආ) එම විචල්‍යයන් සඳහා උදාහරණ සපයන්න. (ල.02)

(iv) රුවන්ති අවුරුදු 32 ක් ආචාර්යවරියක ලෙස සේවය කර විශ්‍රාම ගත්තාය. විශ්‍රාම යාමේදී ලැබෙන පාරිතෝෂිත මුදල අවධානම අඩු ප්‍රතිලාභ වැඩි ආයෝජන මාර්ගයක යෙදවීමට අපේක්ෂා කරයි.

(අ) ඇයට තෝරාගත හැකි ආයෝජන මාර්ගයක් නම් කරන්න.

(ආ) එහි ප්‍රතිලාභ 2ක් දක්වන්න. (ල.02)

## II කොටස - ගිණුම්කරණය

**ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

5) (i) පහත සඳහන් ප්‍රකාශන අයත්වන්නේ ගනුදෙනුවකටද නැතිනම් සිද්ධියකටද යන්න වෙන වෙනම සඳහන් කරන්න.

(අ) රු.25,000 කට භාණ්ඩ මිලට ගැනීම

(ආ) රු.20,000 ක් වටිනා භාණ්ඩ තොගයක් කල් ඉකුත් වී තිබීම. (ල.02)

(ii) ව්‍යාපාරයක සිදු වූ පහත සඳහන් ගනුදෙනු සඳහා අවශ්‍ය ද්විත්ව සටහන ලියා දක්වන්න.

(අ) ණයහිමියන්ට ගෙවූ මුදල රු.12,000 කි. ලද වට්ටම රු.3,000 කි.

(ආ) රු.5,000 ක් වූ පෞද්ගලික දුරකතන බිල ව්‍යාපාරයේ මුදලින් ගෙවීම. (ල.02)

(iii) රංගගේ ව්‍යාපාරයේ 2023/01/01 දිනට මුළු වත්කම් හා වගකීම් පහත පරිදි වේ.

ලීබඩු රු.50,000

භාණ්ඩ තොගය රු.40,000 ණයගැතියෝ රු.20,000 මුදල් ශේෂය රු.75,000 ණයහිමියෝ රු.32,000

2023 ජනවාරි මාසය තුල රංගගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| දිනය | වත්කම් | = | | | හිමිකම් | + වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | ලී බඩු | භාණ්ඩ තොගය | ණයගැතියෝ | මුදල් | | ණයහිමියෝ | බැංකු ණය |
| 1/5 | | +10,000 | | -10,000 | | | |
| 1/10 | | | | +50,000 | | | +50,000 |
| 1/20 | | -8,000 | +10,000 | | +2000 | | |
| 1/25 | | -12,000 | | +15,000 | +3,000 | | |
| 1/28 | | | | -3,000 | -3,000 | | |

අවශ්‍ය වන්නේ.

(අ) 2023/01/10 දින සිදු වී ඇති ගනුදෙනුව වටිනාකම සහිතව ලියන්න.

(ආ) 2023/01/28 දිනට ව්‍යාපාරයේ මුළු හිමිකම් වල වටිනාකම කොපමණද?

(ඉ) 2023/01/28 දිනට ව්‍යාපාරයේ මුළු ජංගම වත්කම් වල වටිනාකම කොපමණද?

(ඊ) 2023/01/31 දිනට පහත සඳහන් ගනුදෙනුව ඉහත ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.
රංග රු5,000 ක් පුද්ගලික ප්‍රයෝජනයට ගැනීම

(iv) විනුගේ තොග වෙළෙඳ ව්‍යාපාරයේ 2023 අගෝස්තු මාසයේ සිදුවූ ගනුදෙනු පහත වේ.

2023/08/05 ඉ.අ.135 භාණ්ඩ තොගයක් රු.50,000 කට වරුණිට ණයට විකුණන ලදී.

2023/08/10 ල.අ.028 රු.45,000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට විකුණන ලදී.

2023/08/15 ඉ.අ.136 රු.30,000 ක භාණ්ඩ තොගයක් සමාලිට ණයට විකුණන ලදී. වෙළෙඳවට්ටම 5%කි.

අවශ්‍ය වන්නේ, 2023 අගෝස්තු මාසයේ -

(අ) විකුණුම් ජ'නලය

(ආ) විකුණුම් ගිණුම

(ඉ) මුළු විකුණුම් වටිනාකම (ල.12)

6) (i) ගිණුම්කරණයේදී වැරදි සිදුවිය හැකි අවස්ථා 2ක් සඳහන් කරන්න. (ල.02)

(ii) රුක්ෂානිගේ ව්‍යාපාරයේ 2022/12/31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුම සමාන නොවිය. එහි වෙනස වූ රු.39,00 ක් අවිනිශ්චිත ගිණුමේ බැරට සටහන් කරන ලදී. වෙනසට හේතු පහත දැක්වේ.

1. රු.4,000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත්වලින් මගහැරී ගොස් ඇත.
2. ලද කුලී ආදායම රු.3,000 මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.
3. අත්පිට විකුණුම් රු.5,400 ක මුදල මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇති අතර විකුණුම් ගිණුමේ සටහන් කර ඇත්තේ රු.4,500 ක් ලෙසය.

අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම (ල.04)

(iii) අමාලිගේ ව්‍යාපාරයේ 2023/04/30 දිනට බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු.14,000 ක් විය. නමුත් එදින බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය වෙනස් විය. වෙනසට හේතු ලෙස පහත සඳහන් කරුණු අනාවරණය විය.

1.ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවූ රක්ෂණ වාරිකය රු.4,000 කි.

2.ණයගැතියෙකු විසින් ඍජුවම බැංකුවේ තැන්පත් කල ප්‍රේෂණ රු.8,000 කි.

3.අප්‍රේල් මාසයේ ණයහිමියෙකුට නිකුත් කල රු.26,000 ක් වූ චෙක්පත බැංකුවට ඉදිරිපත් කර නොමැත.

4.අප්‍රේල් මාසයේ තැන්පත් කල රු.12,000 ක චෙක්පත උපලබ්ධි වී නොමැත.

අවශ්‍ය වන්නේ,

(අ) 2023/04/30 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2023/04/30 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ල.04)

(iv) ලක්ජය ක්‍රීඩා සමාජයේ 2022 වර්ෂයේ සාමාජික සංඛ්‍යාව 100 කි. වාර්ෂික සාමාජික මුදල රු.1,000 කි.

2022 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් පිළිබද තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| සාමාජික ගාස්තු ලැබීම් | රු.80,000 |
| පරිත්‍යාග | රු.46,000 |
| ක්‍රීඩා උපකරණ ගැණුම් | රු.24,000 |
| ක්‍රීඩා පිටිය නඩත්තු | රු.16,000 |
| ක්‍රීඩා පුහුණුකරුවන්ගේ වේතන | රු. 70,000 |

අවශ්‍ය වන්නේ,

2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න. (ල.02)

7) (i) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගැලපුම් සටහන් යොදා ගැනීමේ සාධාරණත්වය පැහැදිලි කරන්න. (ල.02)

(ii) වත්කමක වාර්ෂික ක්ෂය ප්‍රමාණය තීරණය කිරීම සඳහා සලකා බලනු ලබන සාධක මොනවාද? (ල.02)

(iii) සපුමල්ගේ ව්‍යාපාරයේ 2022/12/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 450,000 |
| බඩු තොගය 2022/01/01 දිනට | 50,000 | |
| ගැණුම් | 75,000 | |
| විකුණුම් | | 300,000 |
| ණයගැතියෝ | 25,000 | |
| ණයහිමියෝ | | 75,000 |
| 10% බැංකු ණය | | 100,000 |
| ගෙවල් කුලී ආදායම් | | 25,000 |
| 10% ආයෝජන | 50,000 | |
| රක්ෂණ ගාස්තු | 11,000 | |
| ලිපිද්‍රව්‍ය | 2,500 | |
| පුචාරණය | 10,000 | |
| ලද වට්ටම් | | 5,000 |
| දුන් වට්ටම් | 1,000 | |
| ඉඩම් ගොඩනැගිල් (පිරිවැයට) | 500,000 | |
| ලීබඩු (පිරිවැයට) | 200,000 | |
| ක්ෂය වෙන්කිරීම්(2022.01.01දිනට ) | | |
| • ඉඩම් ගොඩනැගිලි | | 50,000 |
| • ලීබඩු | | 20,000 |
| බැංකු ගාස්තු | 500 | |
| මුදල් | 100,000 | |
| | 1,025,000 | 1,025,000 |

අමතර තොරතුරු -

- 2022/12/31 දිනට තොගය රු.25,000 කි.
- ජංගම නොවන වත්කම් වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය පදනම් කරගෙන 5% බැගින් ක්ෂය කල යුතුය.
- ණයගැතියන්ගෙන් රු.2,000 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

(අ) 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ල.04)

(ආ) 2022/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ල.04)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න